**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ (“මණ්ඩලය”) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

#### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 47 ඡේදය ප්‍රකාරව සහ මණ්ඩලයේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව මෝටර් රථ වාහන ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුව ද රු.10,541,000 ක් වූ මෝටර් රථ වාහන පිරිවැය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර තිබුණි. | මෙම මෝටර් රථ ප්‍රත්‍යාගණනයන් මෙම වසරේදී සිදු කිරීමට නියමිත අතර ඉදිරියේදී ගිණුම් ප්‍රමිත ප්‍රකාරව කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | ගිණුම් ප්‍රමිත ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර ගිණුම්වල දැක්විය යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2020 ඔක්තෝබර් 13 දිනැති 20/1468/340/002 දරන අමාත්‍ය මණ්ඩල තීරණයේ 16.46(i)(ඇ) ඡේදය. | අදාල අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මණ්ඩලයේ සභාපතිවරයාට විශ්ව විද්‍යාල ආචාර්ය තනතුරට හිමි වැටුප සහ දීමනා පමණක් ගෙවිය හැකිව තිබිය දී අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව සභාපති තනතුරට හිමි 2022 වර්ෂයේ වැටුප ලෙස රු.1,079,032 ක් ගෙවා තිබුණි. | 2020 ඔක්තෝබර් 13 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 20/1468/340/002 හි අර්ථ දක්වා ඇති පරිදි එම කාලය තුල සම්පූර්ණ දීමනාව ගෙවූ අතර සම්පූර්ණ දීමනාව ගෙවීම පිළිබඳව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබූ පිළිතරු ලිපියට අනුව 50% ක දීමනාවක් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත ගෙවන ලදී. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති ලේකම් කාර්යාල ලිපියේ 01 ඡේදය සහ පොදු ව්‍යාපාර කාරක සභාවේ 2012 ජූලි 10 දිනැති අංක 07 නියෝගය | මණ්ඩලය රජයේ ගොඩනැගිල්ලක පවත්වාගෙන යායුතු වුවද, මණ්ඩලය ආරම්භයේ සිට වසර 23 ක පමණ කාලයක් කුලියට ලබාගත් පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන ගොස් තිබුණු අතර, ඒ වෙනුවෙන් 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ගොඩනැගිලි කුලී වශයෙන් රු.33,794,800 ක් වැය කර තිබුණි. | රාජ්‍ය අංශයේ ස්ථානයකට ගෙනයාමට උත්සාහ කරන ලද අතර රජයේ ගොඩනැගිල්ලක් ලබා ගැනීම සම්බන්ධව අමාත්‍යාංශය සමගද විටින් විට සාකච්ඡා පවතී. මේ පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරියට හා වෙනත් රාජ්‍ය අංශවලට ලිපි ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන හා පොදු ව්‍යාපාර කාරක සභා නියෝග ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1970 අංක 38 දරන මුදල් පනතේ 13(8) වගන්තිය | පනතේ 7 වන උප වගන්තියේ (ඒ) සහ (බී) ඡේදවලට අනුව ඉදිරිපත් කෙරෙන වාර්තා අදාළ රාජ්‍ය සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් සලකා බැලිය යුතුය. එසේ සලකා බැලීමෙන් පසු එම පාලක මණ්ඩලය විසින් විගණන වාර්තාවේ පෙන්වා දී ඇති කරුණු පිළිබඳව ගැනීමට යෝජිත පියවර , විගණන වාර්තාව | පිළිතුරු ලබා දී නොමැත. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද දින සිට මාස තුනක් තුළ විගණකාධිපති වෙත දන්වා සිටිය යුතු වුවද, 2020 හා 2021 වර්ෂවල එසේ කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,653,272 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අලාභය රු.3,381,173 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,034,445 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ඉකුත් වර්ෂයට සාපේක්ෂව රජයේ ප්‍රදාන සියයට 22කින් වැඩි වීම, වෙනත් වියදම් සියයට 21 කින් අඩුවීම සහ හුවමාරු හා ප්‍රදාන වියදම සියයට 42 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව පුවත්පත් ලියාපදිංචි කිරීම් හා එසේ ලියාපදිංචි කිරීම් වෙනුවෙන් ගාස්තු අයකිරීම සඳහා වූ නියෝග සංශෝධනය විය යුතු වුවද තාක්ෂණික දියුණුවත් සමග ඊ-පුවත්පත් ප්‍රකාශනය ක්‍රමයෙන් වර්ධනය වී ඇති අතර එම පුවත්පත් ලියාපදිංචිය සම්බන්ධයෙන් පනතේ විධිවිධාන සංශෝධනය කර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | 2021.01.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අමාත්‍යාංශ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් විද්වත් කමිටුවක් පත්කර එමගින් පනත සංශෝධන ක්‍රියාවලිය ඉදිරියට ක්‍රියාත්මක කරන ලෙස තිබුණ ද, මණ්ඩලයට පාලනය කල නොහැකි ඇතැම් කරුණු නිසා විද්‍යුත් හා නව මාධ්‍යයන්ටද අදාළ වන පරිදි පනත ප්‍රතිව්‍යුහගතකරණය කර මණ්ඩලය මගින් කෙටුම්පතක් ද ඉදිරිපත් කර ඇති පසුබිමක් තුල අවශ්‍ය ප්‍රතිව්‍යුහගතකරණය ක්‍රියාවලිය සිදුකිරීමට නොහැකි විය. එසේම 2022.12.20 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් පුවත්පත් ලියාපදිංචි ගාස්තු වැඩි කිරීමට අදාළ මණ්ඩලයේ ඉල්ලීමද අමාත්‍ය මණ්ඩලය මගින් ප්‍රතික්ශේප කර තිබේ. | පුවත්පත් මණ්ඩල පනත අනුව කටයුතු කල යුතු අතර e-පුවත්පත් ලියාපදිංචි වීමෙ අවශ්‍යතාවය හා ඵලදායීතාවය නිවැරදිව ඇස්තමේන්තු කර පනතේ විධිවිධාන සංශෝධනය කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)පුවත්පත් මණ්ඩල පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව පුවත්පත් වලට හා කර්තෘවරුන් ආදීන්ට විරුද්ධව මහජනතාව හා විවිධ ආයතන වලින් ලද පැමිණිලිවලට මණ්ඩලය විසින් ක්‍රියා කළ යුතුය. සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රවෘත්ති පත්‍ර වලට විරුද්ධව මහජනතාව සහ විවිධ ආයතන වලින් ලද පැමිණිලි 34 ක් සහ 2021 වර්ෂයේ නොවිසඳී ඉදිරියට ගෙනා පැමිණිලි 35 ක් ද ඇතුළුව මුළු පැමිණිලි සංඛ්‍යාව 69 ක් වූ අතර ඉන් පැමිණිලි 23 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විමර්ශනය වෙමින් පැවතුණි. | පැමිණිල්ලක් ලද විගස සති 2 ක් ඇතුළත පරික්ෂණ කැඳවනු ලැබේ. තවත් සති 02 කින් රෙගුලාසි ප්‍රකාරව පරික්ෂණ ආරම්භ කරනු ඇත. තවද විවිධ කරුණු මත පරික්ෂණ දීර්ඝ කාලීනව විභාග කිරීම් සිදු වනු ඇත.<br><br>සමස්තයක් වශයෙන් ගත් කළ විවිධ කරුණු හා මණ්ඩලයට පාලනය කළ නොහැකි හේතූන් නිසා පරීක්ෂණ ප්‍රමාද වීමේ හැකියාවක් ඇත. | පුවත්පත් පැමිණිලි සඳහා විසඳුම් ලබාදීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ආ)පුවත්පත් මණ්ඩල පනතේ 30 වන වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි නොකර වෙළඳපලට නිකුත් කරන පුවත්පත් සම්බන්ධව අවශ්‍ය රීති හා නියෝග සම්පාදනය කර නොතිබුණි. | 2021.01.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අමාත්‍යාංශ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් විද්වත් කමිටුවක් පත්කර එමගින් පනත සංශෝධන ක්‍රියාවලිය ඉදිරියට ක්‍රියාත්මක කරන ලෙස දන්වා ඇත. විද්‍යුත් හා නව මාධ්‍යයන්ටද අදාළ වන පරිදි පනත ප්‍රතිව්‍යුහගතකරණය කර මණ්ඩලය මගින් කෙටුම්පතක් ද ඉදිරිපත් කර ඇති පසුබිමක් තුල අවශ්‍ය ප්‍රතිව්‍යුහගතකරණය ක්‍රියාවලිය සිදුකිරීමට නොහැකි විය. එසේම 2022.12.20 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් පුවත්පත් ලියාපදිංචි ගාස්තු වැඩි කිරීමට අදාළ මණ්ඩලයේ ඉල්ලීමද අමාත්‍ය මණ්ඩලය මගින් ප්‍රතික්ශේප කර තිබේ. කෙසේවෙතත් 2023.04.06 දිනැති ලිපිය මගින් වගන්ති සංශෝධනය විය යුතු ආකාරය දන්වා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. | ලියාපදිංචියෙන් තොරව අලෙවිකරණ පුවත්පත් පිළිබඳ රීති හා නියෝග සම්පාදනය කර විමර්ශණය කිරීමට මණ්ඩලය කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදි හඳුනා ගන්නා ලද පරිඝණක 02 ක ඌනතාවය හා 2022 වර්ෂයේදි හඳුනා ගන්නා ලද පරිඝණක 01 ක ඌනතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි අදාළ පරීක්ෂණ පවත්වා අලාභය අයකර ගැනීමට 2023 මාර්තු වන විටත් කටයුතු කර නොතිබුණි. | මෙම පරිගණක ඌනතාවය පිළිබඳව නැවත සොයා බැලීම සඳහා නිලධාරීන්ට උපදෙස් දී ඇති අතර මෙය ඉවත් කිරීමට නියමිතව තිබූ පරිඝණක භෞතිකව ඉවත්කලත් ගිණුම් පොත් වලින් ඉවත් නොවුවාද යන්න පිළිබඳවත් සොයා බලන ලෙස උපදෙස් ලබාදෙන ලදී. එසේම ඉදිරියේදි මෙවැනි තත්ත්වයන්වලදී මූල්‍ය රෙගුලාසි අනුව කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |